**ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා පෞද්ගලික සමාගම - 2018**

---

## 1.1 මතය

------

ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා පෞද්ගලික සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදු වන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 7(1), 8(1) හා 23 වන වගන්තිය | පනතේ අවශ්‍යතාවයන් පරිදි කටයුතු කිරීම සඳහා තොරතුරු නිලධාරියකු පත් කිරීම ඇතුළු විධිවිධාන යොදා නොතිබුණි. | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනතේ නිර්වචනය කර ඇති පොදු අධිකාරී (Public Authority) යටතට 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත අප සමාගම යටත් විය යුතුද යන්න පිළිබඳව නෛතික උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව මෙහි ඔබේ i, ii සහ iii යන අවශ්‍යතාවලට අනුකූල වීමට කටයුතු | තොරතුරු දැන ගැනීමේ පනත ප්‍රකාරව කටයුතු කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කරනු ලැබේ. | |
| (ආ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පීඊඩී/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය. | | | |
| | (i) 7.4.1 වගන්තිය | සමාගම විසින් අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර විගණන කමිටු රැස්වීම් ද පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ගැනීම සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩලයේ අවධානය යොමු වී ඇත. ඒ අනුව ඉදිරියේදී මෙම විධි විධාන හා අනුගත වීමට කටයුතු කරනු ලැබේ. | යහපත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ලෙස ඵලදායී අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |
| | (ii) 7.4.5 වගන්තිය | සමාගම විසින් වාර්ෂිකව භාණ්ඩ සමීක්‍ෂණ සිදු කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් 2019 වසරේ සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |
| | (iii) 9.3.1 වගන්තිය | මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකගත්වය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය හා අදාලරේඛීය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් (Schemes of Recruitments) සමාගම සතුව නොතිබුණි. | අනුගත වීමට කටයුතු කරනු ලැබේ. | බඳවා ගැනීමේ විධිමත් පටිපාටියක් අනුගමනය කිරීම සමාගමේ පහපැවැත්මට හේතුව වන බැවින් ඒ සඳහා කළමනාකරණය ක්‍රියා කල යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම 2002 ජූලි 10 දින සම්පත් බැංකුවේ තැන්පත් කරන ලද අංක 29/4092 දරණ රු. 5,962,500 ක් වටිනා ඒක්ෂණ තැන්පතුවට අදාල මුල් පිටපත 2018 දෙසැම්බර් 31 දිනට සමාගම සතුව පැවතියද අදාල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල සඳහන් නොවුණි. එසේම එම තැන්පතුව මුදල් කල බවට සනාථ කෙරෙන ලියවිලි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | මෙම ඒක්ෂණ තැන්පතුව කල් පිරීමේදී නැවත ආයතනයේ ගිණුම වෙත අදාල පොළිය සමඟ බැර කර ඇති බව බැංකුව විසින් වාචිකව තහවුරු කර ඇති අතර ලිඛිත තහවුරුවක් කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කරනු ලැබේ. | තැන්පතු ස්ථාවර සහ පොළි ලැබීම පිළිබඳ විධිමත් පාලනයක් සහිතව ගිණුම්කරන ක්‍රමවේදයක් ඇති කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |
| (ආ) | චෙක්පත් මගින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සලකා බැලිය යුතු වුවත් සමාගමේ බැංකු ශේෂය අයිරා වීම හේතුවෙන් 2018 වර්ෂයේදී බැංකු අයිරා පොලිය වශයෙන් රු.646,486 ක් ගෙවා තිබුණි. | 2018 වසර ආයතනයේ කාරක ප්‍රාග්ධන ගැටළු විසඳා ගැනීම සඳහා අයිරා පහසුකම් ලබා ගැනීමට සිදු විය. මේ වන විට එම ගැටළු විසඳා ඇති අතර අයිරා පහසුකම් අත්‍යවශ්‍ය අවශ්‍යතාවයන් යටතේ පමණක් ලබා ගනු ලැබේ. | චෙක්පත් මගින් ගෙවීම් කිරීමේදී බැංකු ශේෂය පරීක්ෂා කර බලා චෙක්පත් නිකුත් කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 11,795,288 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.9,413,967 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,381,321 ක වැඩි වීමක් නිරීක්ෂණය විය. මෙම වැඩි වීමට ඍජු වියදම් අඩුවීම සහ වෙනත් ආදායම්වල වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| ආදායම | 80,236,520 | 81,467,514 |
| ඍජු වියදම් | (52,363,656) | (59,212,477) |
| වෙනත් ආදායම් | 4,859,675 | 433,652 |
| | 32,732,540 | 22,688,689 |
| පරිපාලන වියදම් | (29,848,247) | (29,105,515) |
| මෙහෙයුම් ලාභය | 2,884,293 | (6,416,828) |
| ශුද්ධ මූල්‍ය ආදායම | 12,506,801 | 15,078,915 |
| බදු පෙර ලාභය | 15,391,094 | 8,662.087 |
| ආදායම් බදු | (3,595,807) | 751,880 |
| බදු පසු ශුද්ධ ලාභය | 11,795,288 | 9,413,967 |

පහත සඳහන් නිරීක්ෂන කරනු ලැබේ.

(i) පසු ගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 1,230,994 කින් අඩු වී තිබුණු අතර වෙනත් ආදායම් රු. 4,426,023 කින් වර්ධනය වී තිබුණි.

(ii) 2017 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඍජු වියදම් සියයට 12 කින් අඩු වී තිබුණු අතර ශුද්ධ මූල්‍ය ආදායම සියයට 17 කින් අඩු වී තිබුණි.

(iii) 2017 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සේවක පිරිවැය රු. 6,131,049 කින් වැඩි වී තිබුණු අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 44 ක වර්ධනයකි. විස්තර පහත පරිදි වේ.

| | 2018 | 2017 | වෙනස |
|---|---|---|---|
| | ------- | ------ | ------ |
| | රු. | රු. | රු. |
| වැටුප් හා වේතන | 17,120,813 | 11,966,009 | 5,154,804 |
| වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 473,509 | 382,648 | 90,861 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 1,710,122 | 962,872 | 747,250 |
| සේවක සුභසාධන වියදම් | 878,185 | 684,141 | 194,044 |
| වෛද්‍ය රක්ෂණ | 723,359 | 779,269 | (55,910) |
| | -------------- | --------------- | ------------- |
| | 20,905,988 | 14,774,939 | 6,131,049 |
| | ========= | ========= | ======== |

## 2.3 අනුපාත විශ්ලේෂණය

| | | 2018 | 2017 |
|---|---|---|---|
| i. | ජංගම වත්කම් අනුපාතය | 1.99:1 | 2.28:1 |
| ii. | ක්ෂණික වත්කම් අනුපාතය | 1.98:1 | 2.26:1 |
| iii. | දළ ලාභ අනුපාතය | 34.74% | 27.32% |
| iv. | ශුද්ධ ලාභ අනුපාතය | 11.8% | 11.5% |

පහත සඳහන් නිරීක්ෂන කරනු ලැබේ.

- 2017 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 2.28:1 හා 2.26:1 වු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එය පිළිවෙලින් 1.99:1 හා 1.98:1 ක් ලෙස අඩු වී තිබුණි.

- 2017 වර්ෂයේ සියයට 27 ක් ව පැවති දළ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේ දී සියයට 34 දක්වා වැඩි වී තිබුණි. මේ සඳහා ඍජු වියදම් වල පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

- 2017 වර්ෂයේ සියයට 11.5 ක්ව පැවති ශුද්ධ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 11.8 ක් දක්වා වැඩි වී තිබුණි.

## 3. ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩ ප්‍රවාහන නෞකාවලට තොග භාණ්ඩ, බෑම හා පැටවීම (Loading, Unloading) සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට පෞද්ගලික කම්කරුවන් ලබාදීම සඳහා 2018 පෙබරවාරි 15 දින කාණ්ඩ 03 ක් යටතේ සැපයුම්කරුවන් 09 දෙනෙකු | නමුත් අප විසින් එම සේවය ප්‍රායෝගික තත්ත්වයන් යටතේ ඉතාම ප්‍රශස්ත මට්ටමින් වරාය අධිකාරියට මේ වන තෙක්ම සපයා ඇත . 2019 වර්ෂයේ දී නව සැපයුම්කරුවන් බඳවා | සේවා සැපයීම පිළිබඳව කොන්දේසි ඇතුලත් ගිවිසුම්වලට එළඹීම මගින් ගිවිසුම්ගත දෙපාර්ශවය විසින් කොන්දේසි අනුව කටයුතු කිරීම නිසා ගැටළු සහ ආරාවුල් අවම වේ. නීත්‍යානුකූල පසුබිමක්ද ලැබේ. මේ නිසා මෙම සේවා |

| | | |
|---|---|---|
| තෝරාගෙන සේවකයන් සේවයේ යොදවා තිබූ නමුත් මෙම සැපයුම්කාර ආයතන සමග සමාගම ගිවිසුම්වලට එළඹ නොතිබුණි. මේ හේතුවෙන් අඛණ්ඩව සේවා සැපයීම සහ සාධාරණ පදනමක් මත සේවා ලබා ගැනීම පිළිබඳ ගැටළු ඇති වීමේ අවධානම විගණනයේදී බැහැර කල නොහැකි විය. | ගැනීමේදී ඔබ විසින් පෙන්වා දුන් පරිදි සේවා ගිවිසුමකට එලැඹීමට කටයුතු කරනු ලැබේ. | සැපයීම සම්බන්ධ ගිවිසුම්වලට එළඹීමට කළමනාකරණය කටයුතු කල යුතු වේ.. |